## සමාජ සේවා, සුභසාධන හා පශුසම්පත් සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම් ලද ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. තනතුර : සාමාන්‍යාධිකාරී - HM 2-1-2006

### තනතුරට අදාළ කාර්යයන්හි ස්වභාවය

ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලයේ උසස්ම මට්ටමේ විධායක නිලධාරියා වනුයේ සමාන්‍යාධිකාරී තුමායි. සාමාන්‍යාධිකාරී ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලයේ සියලුම කටයුතු, පරිපාලන හා මූල්‍ය කටයුතු පිළිබඳව වගකීම් දරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය මග පෙන්වීම සහ පාලනය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පැවරීම මත ඔවුන්ගේ බලය, කාර්යයන් හා වගකීම් භාවිතාකර, ඉටුකර හා බලය ක්‍රියාත්මක කරන අතර ආයතනයේ ජයග්‍රහණය සඳහා මෙම මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට නායකත්වය සහ දිරිය ලබාදෙයි.

**සුදුසුකම්** : විද්‍යාව / කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය / පශු වෛද්‍ය විද්‍යාව විෂයෙහි ප්‍රාථමික උපාධියක් සමග පශ්චාත් උපාධියක් (මාස්ටර්ස් උපාධිය) හෝ ඉහත සඳහන් ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය / ආශ්‍රිත සාමාජිකත්වය සමග ගොවිපල / වැවිලි කළමනාකරණය හා සත්වපාලනය යන ක්ෂේත්‍රයන්හි නියුතු පිළිගත් රාජ්‍ය / පුද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර පහක (05) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්දක් ඇතුළුව ඉහත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර විස්සක (20) පළපුරුද්දක් තිබිය යුතුයි.

සහ

බහු කාර්ය කණ්ඩායම් වෙත නායකත්වය සහ මගපෙන්වීම ලබා දිය හැකි සතාට කළ හැකියාව සහ මණ්ඩලයේ මානව හා අනිකුත් සම්පත් හරියාකාරව යොදා ගැනීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.

**වයස** : අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි.

**වැටුප** : HM 2-1-2006 : රු. 44,030/- - 12x1,310/- - 59,750/-

**වෙනත්** : අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වෘත්තීය දීමනාවක් ගෙවිය හැක.

**අමතර ප්‍රතිලාභ** : මාසිකව කි.මී. 940 ක පුද්ගලික ගමන් සහිතව වාහනයක් ලබාදෙනු ලැබේ.

මෙම තනතුර සඳහා ඉහත සඳහන් දීමනාවන්ට අමතරව පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ.

අ) රජය විසින් අනුමත කරන ලද දීමනා

ආ) අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

**සෑම අයදුම්කරුවකුම.**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

ii. විශිෂ්ඨ චරිතයකින් හෙබි අයකු විය යුතුයි.

iii. ඉංග්‍රීසියෙන් රාජකාරි කිරීමේ හැකියාව අත්‍යවශ්‍යයි.

සියලුම තොරතුරුවලින් සමන්විත, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනය සහ දුරකථන අංක ඇතුළත් ඒව දත්ත සහිත තමන් විසින් සකස්කරගන්නා ලද අයදුම්පත් සහතිකවල පිටපත් සමග 2015 ජුලි 17 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "සභාපති", ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුයි.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**අංක 40, නාවල පාර,**
**නාරාහේන්පිට, කොළඹ 05.**